සම මෙත සම සිත සම ජීවනය ගැන ඕල්කට් චරිතයෙන් අදටත් පාඩම් උගත හැකියි

ඩුබායි හී හොලිඩේ ඉන් එක්ස්ප්‍රස් හෝටලයේ පැවැති ඕල්කට් ගුණසමරුවේදී හිටපු අමාත්‍ය නීතිඥ ඉම්තියාස් බාකීර් මාකාර් කියයි

ශ්‍රී ලංකාවේ බෞද්ධ විද්‍යාල ආරම්භ කිරීමේ පුරෝගාමියා වූ හෙන්රි ස්ටීල් ඕල්කට්තුමන් පිළිබඳ 2015 වාර්ෂික ගුණසමරු දේශනය කීර්තිමත් ආදි ආනන්දියකු වන හිටපු ජනමාධ්‍ය හා විදුලි සංදේශ අමාත්‍ය ඉම්තියාස් බාකීර් මාකාර් මහතා විසින් සිදු කළ දේශනයයි.

බෞද්ධ දර්ශනයෙන් සිය ජීවිතයේ ගමන්මග ආලෝකමත් කරගත් හෙන්රි ස්ටීල් ඕල්කට්තුමන් සියලු දෙනාටම ආදර්ශවත් චරිතයක් බව එතුමන්ගේ වාර්ෂික ගුණසමරු දෙසුම සිදුකරමින් කීර්තිමත් ආදි ආනන්දියකු වන හිටපු ජනමාධ්‍ය හා විදුලි සංදේශ අමාත්‍ය නීතිඥ ඉම්තියාස් බාකීර් මාකාර් මහතා පැවසීය.

ශ්‍රී ලංකාවේ බෞද්ධ විද්‍යාල ආරම්භ කිරීමේ පුරෝගාමියා වූ හෙන්රි ස්ටීල් ඕල්කට්තුමන් පිළිබඳ 2015 වාර්ෂික ගුණසමරු දේශනය කීර්තිමත් ආදි ආනන්දියකු වන හිටපු ජනමාධ්‍ය හා විදුලි සංදේශ අමාත්‍ය ඉම්තියාස් බාකීර් මාකාර් මහතා විසින් සිදු කළේය.

ඩුබායිහි හොලිඩේ ඉන් එක්ස්ප්‍රස් හෝටලයේදී ඊයේ (07) පස්වරුවේ පැවැති මෙම ගුණ සමරු දේශනය 'බහු සංස්කෘතික පරිසරයක් තුළ විචාරාත්මක හා සමෘද්ධිමත් ජීවිතයක්' යන තේමාවෙන්ද පැවැත්විණි.

ඩුබායිහිදී පැවැත්වෙන මෙම උත්සවය සංවිධානය කරනු ලැබුවේ එහි වෙසෙන ආනන්ද, නාලන්දා, මහනුවර ධර්මරාජ, ගාල්ල මහින්ද හා පන්නිපිටිය ධර්මපාල විද්‍යාල වැනි විද්‍යාලවල ආදි සිසුන්ගෙන් සමන්විත ඕල්කට් සමරු පදනම විසිනි.

එහිදී බාකීර් මාකාර් මහතා කළ සම්පූර්ණ දේශනය මෙසේය.

"ලෝකයේ විවිධ සංස්කෘතීන් එක්වන සුවිශේෂී ස්ථානයක සිට ඕල්කට් දේශනය පවත්වන්නට මේ ලැබුණු අවස්ථාව ගෞරවයක්. එමෙන්ම වරප්‍රසාදයක් ලෙස මම සලකනවා.

2004 වසරෙන් පසුව ඒ කියන්නේ වසර 11කට පසුව මා විදේශගත වූ ප්‍රථම අවස්ථාව මෙයයි. දේශන, වැඩමුළු සඳහා මෙන්ම පෞද්ගලික සංචාර සඳහාත් විදේශගත වන්නට නොයෙකුත් ආරාධනා පසුගිය කාලයේදී මට ලැබුණත් ඒවා භාරගන්නට මගේ උනන්දුවක් තිබුණේ නැහැ. එහෙත් ආනන්දය කියන්නේ මා හැදුණු වැඩුණු තැන. ආනන්දය ඇතුළු ඕල්කට් පාසල්වල නිර්මාතෘතුමන්ට ගෞරව දක්වන මේ අවස්ථාව ප්‍රතික්ෂේප කරන්න මට පුළුවන්කමක් නැහැ.

ආදි ආනන්දියකු ලෙස සහෝදර ආදි ආනන්දීයයන් සහ අපේ සහෝදර ඕල්කට් පාසල්. ආදි සිසුයෙන් වන ඔබ සැම සමග මෙවන් තැනක මේ අයුරින් එක්වන්නට ලැබීම සැබැවින්ම සතුටක්.

මේ හමුවීම සඳහා ආරාධනාව මට භාරදෙන්නට ආවේ ආදි ආනන්දියකු සහ ආදි නාලන්දීයෙක්. අප පාසල් අතර සහෝදරත්වයක් තිබුණද ඊට යටින් පුංචි තරගයකුත් තිබෙන බව ඔවුන් හා කතා කරන විට මට දැනුණා. ඒත් එක එදත් තිබුණා. මෙතැන සිටින බන්දුල වර්ණපුර මහතා දකින විට ඒ ගැන මට මතක් වෙනවා. බන්දුල වර්ණපුර එදා අපේ ක්‍රිකට් වීරයා. පාසල් තරගවලදී ඔහු වැඩියෙන් ලකුණු ගන්නා විට අපිට ලොකු සතුටක් දැනුණා. ඒ ඔහු අපේ සහෝදර නාලන්දාවේ නායකයා නිසා. ඒත් ආනන්ද-නාලන්ද තරගයේදී ඔහු බින්දුවට දැවී යෑම අප ප්‍රාර්ථනා කළ බව කීමෙවත් එය නිවැරදියි. ඒ අපි අපේ පාසලට කොහොමත් වැඩියෙන් ආදරේ කීන්දා. ඒත් අපට අමතක කරන්නට බැහැ එදා ආනන්දයටම කියලා සුදුසු ක්‍රීඩා පිටියක් තිබුණේ නැහැ. අපි ක්‍රීඩා පුහුණුවට ගියේ එදා නාලන්දා පිට්ටනියට. සතියේ දින ගණන සහෝදරත්වයෙන් බෙදාගෙන එදා අපි නාලන්දා ක්‍රීඩා පිටියේ ක්‍රීඩා කළා.

ඕල්කට් දේශනය සඳහා ආරාධනාව මට මුලින්ම ලැබුණ අවස්ථාවේදී ඔබ සියලුදෙනා වැනි දැනඋගත් පිරිසකට මට කිව හැක්කේ කුමක්ද යන්න ගැන පුංචි පැකිලීමක් තිබුණා. ඒ වගේම ගිය වසරේ මේ දේශනය කළ මගේ මිත්‍ර ආනන්දයේදී සහ ආනන්ද බෝඩිමේ මා සමග එකට සිටි භාෂාවිද සුනිල් විජේසිංහ මහතා පැය දෙකක් පමණ ඔබට කතා කළ බව දිලිප් මට පැවසූ විට මේ ආරාධනාව ගැන මට බයකුත් ඇතිවුණා. මගේ ජීවිතයේ කවදාවත් මම පැය ගණනින් කතා කර නැහැ.

මම මැතිවරණවලට ඉදිරිපත් වූ කාලවලදී ඡන්ද රැස්වීම්වලදීත්, කතා කරන්නට ගන්නේ විනාඩි 20ක පමණ කාලයකුයි. කතා කළ යුතු වෙලාව පිළිබඳ කියද්දී මගේ මතකයට එන්නේ මහත්මා ගාන්ධිතුමන් ලංකාවට පැමිණි අවස්ථාවේදී සිදුවූ සිද්ධියක් ගැන. ජේ.ආර්. ජයවර්ධන හිටපු ජනාධිපතිතුමන් වරෙක කර තිබූ ප්‍රකාශයක්. එතුමා මේ ප්‍රකාශය කළේ 1978දී දෙහිවලපොළ, ගණේගම විහාරයේදී. මම ඔහුගේ කතාව ඔබට උපුටා දක්වන්නම්. ඔහු මෙහෙම කියා තිබුණා.

එක දවසක් මම මහත්මා ගාන්ධිතුමන්ට ආරාධනා කළා දීර්ඝ කතාවක් කරන්නට කියා. එතුමා ගත් කටටම මට දුන්න උත්තරය මෙහෙමයි.

කතා කරන්නට නැගිටිටගම හොඳට හිටගන්න ඕනෙ ඔක්කොටම පේන්න. දැන් මම එහෙමයි හිටගෙන ඉන්නේ. ඊළඟට කතා කරන්න ඕනේ ඔක්කොටම ඇහෙන්න. දැන් මම එහෙමයි කතා කරන්නේ. ඊට පස්සේ ඉක්මන් කරලා ඉඳගන්න ඕනේ ඔක්කොටම ඉක්මනට ප්‍රීති වෙන්න.

අපි පුරුදුවෙලා තියෙනවා දීර්ඝ ලෙස කතා පවත්වන්නට. නමුත් අතීත කථිකයන් වගේ මම පැය ගණන් කතා කරන්නේ නැහැ. විනාඩි 15ක් නැත්නම් 20ක්, වැඩිම වුණොත් විනාඩි 30ක්. යම් කෙනෙක් කියනවා නම් තම අදහස් ප්‍රකාශ කරන්නට පැය භාගයක් මදියි කියලා ඒ අයට මම මෙහෙම කියනවා. බුදු හාමුදුරුවෝ ධම්ම චක්ක පවත්තන සූත්‍රය දේශනා කෙරුවේ මිනිත්තු 10කින්. ජේසුස් වහන්සේ කන්දඋඩ දේශනාව මිනිත්තු 5කින් අවර කළා. මිනිත්තු 5කින් පුරවන් ලෝකය හෙල්ලෙන්න කතාකරන්න. නමුත් මම එවැනි කතාකාරයෙක් නෙවෙයි. තමුන්නාන්සේලා මගේ අදහස් ස්වල්පයක් බලාපොරොත්තු වන නිසා මේ වෙලාවේ මගේ අදහස් ටිකක් කෙටියෙන් ප්‍රකාශ කරන්න කැමැතියි.

ඉතින් මමත්, ජේ.ආර්. ජයවර්ධන මැතිතුමන් අනුව යමින් තමුන්නාන්සේලා සියලුදෙනාටම ඉක්මනින් ප්‍රීති වෙන්නට පුළුවන් විදිහට පැය භාගයක් පමණ කාලය තුළ මගේ කතාව අවසන් කරන්නට උත්සාහ කරනවා.

අදහන ආගම මෙන්ම ඉගෙනගත යුතු මාධ්‍යයද තෝරාගන්නට අප රටේ නිදහස තිබෙනවා. ඒ අනුව මට සිංහල මාධ්‍යයෙන් අධ්‍යාපනය ලබාදෙන්නටත්, ප්‍රාථමික අධ්‍යාපනයෙන් පසු මා ආනන්දයට ඇතුළත් කරන්නටත් මගේ පියතුමන් තීරණය කර තිබුණා. මගේ පියතුමන්ගේ ඒ තීරණය නිවැරදි බව මම අද විශ්වාස කරනවා. ඒ අනුව මා ආනන්දයේ ඉගෙන ගත්තා පමණක් නොව, ආනන්ද බෝඩිමෙන් වසර 7ක් තිස්සේ අපේ වර්තමාන කථානායකතුමන් වන ගරු කරු ජයසූරිය මැතිතුමන්ගේ වචනවලින් කියනවා නම් පරිප්පු කෑ වග කියන්න මම කැමැතියි. එතුමන් මැතකදී කියා තිබුණා ආනන්ද බෝඩිමේ පරිප්පු කෑ අපිට ඕනෑම පරිප්පුවක් කන්න පුළුවන් කියා. ඒ ගැන වැඩියෙන් කියන්නට මම යන්නේ නැහැ. දේශපාලනය මෙතැන නහනම් වචනයක් නිසා.

ලෝකයේ ප්‍රධාන ආගම් සියල්ලේ උපත නැත්නම් කේන්ද්‍රය වී ඇත්තේ ආසියාවයි.

අන් ජාතියේ නිදහස නොදකින්නා තමන්ගේ ජාතික නිදහස නොදකී

> **ඕල්කට්තුමා ශ්‍රී ලංකාවේ බෞද්ධ පුනරුද ව්‍යාපාරයට සිය දායකත්වය ලබාදෙමින් ඇරඹූ ප්‍රධාන ව්‍යාපෘතිය මගින් අපේක්ෂා කළේ රටේ නොදියුණු පළාත්වල දරුවන්ට එලදායී අධ්‍යාපනය ලබාදීමයි.**

කෙසේ වෙතත් ආනන්දය තුළ එදා විවිධත්වයක් තිබුණා. පාසලේ මෙන්ම බෝඩිමේත්, බෞද්ධ, ක්‍රිස්තියානි, හින්දු, මුස්ලිම් දරුවන් සිටියා. අපට ආනන්දය තුළ අප කුමන ආගම් අදහුවත් කිසිදු වෙනසක් දැනුණේ නැහැ. අප සිටියේ එක පවුලක් වගේ. ශිෂ්‍ය නිවාසයේ කනිෂ්ඨ ශිෂ්‍ය සංගමයේ වගේම ජ්‍යෙෂ්ඨ ශිෂ්‍ය සංගමයේත් සභාපති ධුරයට සහෝදර ශිෂ්‍යයන් මා තෝරාගත් හැටි මට මතක් වෙනවා. ටේබල් ටෙනිස්, හොකී කණ්ඩායම්වල නායකත්වයට මෙන්ම සිංහල විවාද කණ්ඩායමේ නායකත්වයටද මට අවස්ථාව ලැබුණු අන්දම මට සිහියට එනවා. ඔබේ අතට පත්ව තිබෙන ටී.බී. ජයාගේ පොතේ සඳහන් වෙනවා කොළඹ සහිරාවේ එකම සිංහල සිසුවා, පාසලේ ප්‍රධාන ශිෂ්‍ය නායකයා ලෙස ටී.බී. ජයා විදුහල්පතිවරයා විසින් තෝරාගනු ලැබූ අයුරු ගැන. මේ තමයි වසර 2500ක ඉතිහාසය, ශ්‍රී ලාංකීය අපට උරුම කළ වටිනාකම්, දායාද කළ සාරධර්ම. ඒ අභිමානවත් උරුමය ගැන අපට ඉතිහාසය තුළින් මනා කරම නිදසුන් දිය හැකියි. ලෝක ඉතිහාසය ගත්තොත් යහපත් ආදර්ශයක් ගතහැකි ආදර්ශමත්, බෞද්ධ, ක්‍රිස්තියානි, හින්දු, ඉස්ලාම් පාලකයන් අපට දැකිය හැකියි. ඒ වගේම ඒ ආගම්වල ප්‍රතිරූපයන් කැළැල් කළ, හානි කළ පාලන යුගයන්ද ඉතිහාසය තුළ දැකිය හැකියි.

ශ්‍රී ලංකා ඉතිහාසයේ ඉතා අප්‍රසන්න කාල පරිච්ඡේදයක් අප පසුකර තිබෙනවා. එය ඉතාම අවාසනාවන්තයි. ඒ අවධිය අපේ රටේ ප්‍රතිරූපයට කැළැල් ඇති කළා. හානි ගෙනදුන්නා. මේ අවාසනාවන්ත සිදුවීම්වලින් පස්සේ දැන් අප එළැඹී ඇත්තේ අපේ රටේ ඉතිහාසයේ සංධිස්ථානයක් වැනි මොහොතකට කියා මා කල්පනා කරනවා. අද ඔබ මට දී ඇති තේමාව මේ මොහොතට ගැළපෙන්නක්.

ඒ සඳහා අප සියලුදෙනාටම විශාල වගකීමක් තියෙනවා. රට අභ්‍යන්තරයෙන් රටින් පිටතත් නව ඇරඹුමක් ඇතිකිරීමට. නව සිතීමක් ඇති කිරීමට. ඒ සඳහා අපේ අතීත උරුමයන් අපට ශක්තිමත් අත්තිවාරමක් සපයනවා, පදනමක් ලබාදෙනවා.

ලෝකයේ ප්‍රධාන ආගම් සියල්ලේ උපත නැත්නම් කේන්ද්‍රය වී ඇත්තේ ආසියාවයි. විශේෂයෙන්ම අපේ සමාජය පෝෂණය කරන බෞද්ධ, හින්දු, ක්‍රිස්තියානි සහ ඉස්ලාම් යන මේ ප්‍රධාන ආගම් ආරම්භ වන්නේ මැදපෙරදිගින් සහ භාරතයෙන්. ශ්‍රී ලාංකීය අපේ මූලයන් සම්බන්ධ වන්නේත් මේ ඓතිහාසික දේශයන්ට. මේ සියලු ආගම් අපට දෙන මඟ පෙන්වීම්වල සමානකම් බොහෝමයක් තිබෙනවා. මට සිහියට එනවා ධම්ම පදයේ එන ගාථාවක්.

'නතං කම්මං කතං සාධු
යං කත්වා අනුතප්පති
යස්ස අස්සු මුඛො රොදං
විපාකං පටි සෙවති'

යම් ක්‍රියාවක් කිරීමෙන් පසු ඒ ගැන යළි සිහියත් කිරීමේදී සතුටු විය හැකි නම් එවන් ක්‍රියාවන් යළි කිරීම මැනවි. යම් ක්‍රියාවක් කිරීමෙන් පසු ඒ ගැන යළි සිහියත් කිරීමේදී පසුතැවිලි වීමට සිදුවන්නේ නම් එවැනි ක්‍රියාවක් කිරීමෙන් වැළකීම මැනවි.

ඒ වගේම මට මතක් වෙනවා ප්‍රසිද්ධ හාවඩ් විශ්ව විද්‍යාලයේ නීති පීඨයට ප්‍රවේශවන ස්ථානයේ ප්‍රදර්ශනය කර ඇති ශුද්ධ වූ කුර්ආනයේ පාඨයක්. එහි අර්ථය මම කැමැතියි ඔබට කියන්න. එය මෙහෙමයි. 'සාධාරණ වන්න. එය ඔබේ දෙමව්පියන්ට හෝ ඥාතීන්ට හෝ මිත්‍රයන්ට එරෙහිව යන්නක් වුවද සාධාරණත්වය වෙනුවෙන් නැගී සිටින්න. දෙවියන් ඔබව ආරක්ෂා කරාවි.'

අපේ සමාජය පොහොසත් කරන මේ සියලු වටිනාකම් පදනම් කරගත් පොදු ගමනක් අප යායුතුව තිබෙනවා. අප අතර ඇති විවිධත්වය සම්පතක් ලෙසින් අප තේරුම්ගත යුතුව තිබෙනවා. එය බරක් කරගත යුතු නැහැ.

ඓතිහාසිකව ලෝකයේ කිසිදු සමාජයක් සුපිරි වර්ගවාදී සිතුම් පැතුම්වලට යෑමෙන් සාර්ථකත්වය ලබාගෙන නැහැ. පළමු ලෝක යුද්ධය මෙන්ම දෙවැනි ලෝක යුද්ධයත් අපට පෙන්නුම් කරන්නේ ඒ සත්‍යයයි. අද මැදපෙරදිග තුළ අප දකින දෑ තුළින්ද එය සනාථ වෙනවා. මේ තත්ත්වයන් පිළිබඳව දේශපාලන නායකයන්ට, ආගමික නායකයන්ට, ව්‍යාපාරික නායකයින්ට ඇඟිලි දික්වෙනවා අපි දකිනවා. විවිධ කුමන්ත්‍රණ සහ සැඟවුණු න්‍යායපත්‍ර මෙවැනි වගකීම් යුතු බවට කියැවෙන දෑ අපට ඇසෙනවා. එහෙත් සමාජයක සියලු පාර්ශ්වවලට මේ සම්බන්ධව වගකීමක් තිබෙනවා. කියැවෙන දෑ ගැන මෙන්ම, සිදුවන දෑ ගැනද අවදියෙන් සිටීම මෙන්ම ගැඹුරින් විමසීම ඉතා වැදගත්.

ඒ වගකීම තේරුම්ගත් පිරිසක් ලෙසින් වැදගත් තේමාවක් සඳහා අප එක් කිරීමට ඔබ කටයුතු කර තිබෙනවා. ඕල්කට්තුමන් සිහිපත් කිරීම සඳහා මේ කාලෝචිත තේමාව තෝරාගැනීම ඔබගේ වැදගත් තීරණයක් ලෙස මම කල්පනා කරනවා. එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ ජීවත්වන ශ්‍රී ලාංකික ඔබ සැම මේ තේමාව මුල් කරගනිමින් මෙලෙස හමුවීමට ලැබීම මා ලැබූ සුවිශේෂී අවස්ථාවක් ලෙසයි මා සලකන්නේ. මෙම හමුවීම සඳහා ඔබ මට කළ ඇරැයුමට පාදක වූ නිමිත්තද මා ඇත්තෙන්ම අගය කරන බව කියන්නට ඕනේ.

> **මා ආනන්දයේ ඉගෙන ගත්තා පමණක් නොව, ආනන්ද බෝඩිමෙන් වසර 7ක් තිස්සේ අපේ වර්තමාන කථානායකතුමන් වන ගරු කරු ජයසූරිය මැතිතුමන්ගේ වචනවලින් කියනවා නම් පරිප්පු කෑ වග කියන්න මම කැමැතියි. එතුමන් මෑතකදී කියා තිබුණා ආනන්ද බෝඩිමේ පරිප්පු කෑ අපිට ඕනෑම පරිප්පුවක් කන්න පුළුවන් කියා. ඒ ගැන වැඩියෙන් කියන්නට මම යන්නේ නැහැ.**

එය එක් පැත්තකින් කෘතගුණ පිළිබඳ වූ මහා පාඩමක් අපට යළිත් සිහියත් කරන්නක්. තවත් පැත්තකින් යුතුකමේ ඉටුකිරීමක්.

කෘතගුණය සහ යුතුකම යන උදාර ගුණාංග දෙකම ඔබටත්, මටත්, අපේ ජීවිතවලටත් සමීප කළේ අපට අකුරු කරවූ පාසල් මැණියන් බව ගෞරවයෙන් සිහිපත් කළ යුතුයි.

ඔබත්, මමත් ඉගෙනගත් පාසල්වලට පොදු වූ ලකුණක් තිබෙනවා. ඒ ශ්‍රී ලංකාවේ බෞද්ධ පුනර්ජීවනයේ පදනම මතින් එම පාසල් ආරම්භ කොට තිබීමයි. ඒ සඳහා නැගවූ කර්නල් හෙන්රි ස්ටීල් ඕල්කට්තුමා බෞද්ධ දර්ශනයෙන් සිය ජීවිතයේ ගමන්මග ආලෝකමත් කරගත් ආදර්ශමත් චරිතයක්. ඕල්කට්තුමන් බිහිකළ පාසල් මාතාවන්ගේ දරුවන් වශයෙන් සෑම වසරකම ඕල්කට් ගුණසමරු දෙසුම ඔබ සංවිධානය කරනුයේ ලොවට කෘතවේදීත්වය පිළිබඳව මහා පාඩමක් කියාදුන් බුදුන් වහන්සේගේ උදාර ගුණය සිහිපත් කරවමින්. උන්වහන්සේ තමා බුද්ධත්වයට පිවිසුන් බෝධියට පුරා සතියක් අනිමිස ලෝචන පූජාවකින් පූජා පැවැත්වූයේ කෘතගුණය පිළිබඳව ප්‍රායෝගික පාඩමක් ලොවට පෙන්වා දෙමින්. ඒ අනුව ඔබ මේ මොහොතේ බුද්ධගමේ හරය හඳුනා ගනිමින් ලොවට සේවය කළ ඕල්කට්තුමාගේ මෙහෙවර ඇගැයීම තුළින් සිදුකරනුයේ ලොව දුර්ලභ වූ කෘතගුණය දැක්වීම සහ දුර්ලභ වූ කෘතගුණ දන්නා පිරිස් අතරට එක්වීමයි.

ශ්‍රී ලංකාවේ සිට සැතැපුම් දහස් ගණනක් ඈත සිටිමින් ඔබ ඉටුකරන මේ මෙහෙවර ශ්‍රී ලංකාවේ අපටත් දැනී තිබෙනවා. මිසිසිපි ගංගා නිම්නයේ සිට මාර්ක් ට්වේන් කවියා වරෙක කීවේ 'ඇතැම් මිනිසුන් යුතුකම් ඉටුකරන විට එහි දෝංකාරය සැතැපුම් ගණනාවක් ඈතට ඇසෙන බවයි' සැබැවින්ම ඕල්කට්තුමන් බිහි කළ විදුහල් මාතාවන්ගේ දරුවන් ලෙස ඔබ ඉටුකරන යුතුකමේ දෝංකාරය ශ්‍රී ලංකාවේ කෘතවේදී ජනතාවගේ දැසට, දෙසවනට පෙනෙනු දැනෙනු නොඅනුමානයි.

සැතැපුම් දහස් ගණන් දුර ගෙවා ඕල්කට්තුමන්ගේ ශ්‍රී ලංකාගමනය සිදුවනුයේත් එවැනිම යුතුකමක් ඉටුකිරීමේ දෝංකාරය ඇමෙරිකාවේ සිටත් වූ එතුමන්ගේ දෙසවනට දැසට යොමුවීම නිසයි. යටත්විජිතවාදය තුළින් පරාධීන වූ ශ්‍රී ලංකාව ආධ්‍යාත්මික වශයෙන් පරාජයට පත්කරන්නට දැරූ උත්සාහයට එරෙහිව පැවැති පංචමහා වාදයන් ඕල්කට්තුමන්ගේ ශ්‍රී ලංකාගමනයට හේතු වුණා.

1865දී බද්දේගම පැවැති වාදයත්, 1866දී උදම්විට පැවැති වාදයත්, 1871දී ගම්පොළ පැවැති වාදයත්, 1873දී අතිශය තීරණාත්මක වාදය ලෙස පැවැති පානදුරාවාදයේත් දෝංකාරය ඕල්කට්තුමන්ගේ ශ්‍රී ලංකාගමනයේ ඉතිහාස කතාවේ බීජයයි. පානදුරාවාදය පිළිබඳ සියලු පුවත් ඇතුළත්ව සිලෝන් ටයිම්ස් පුවත්පතේ පළවූ වාර්තාවක් එයට මඟ පෑදුවා. එකල පුවත්පතේ ප්‍රධාන කර්තෘවරයාව සිටි ජෝන් කූපර් මහතා කෝට්ටේ විසූ නීතිඥ ඇඩ්වඩ් පෙරේරා මහතා ලවා එම වාදය ඉංග්‍රීසියට පරිවර්තනය කර ටයිම්ස් ඔෆ් සිලෝන් පුවත්පතේ පළකරනු ලැබුවා. එම වාර්තා පිටපතක් එවකට ගාල්ලේ විසූ ඇමෙරිකන් පඩිවරයකු වූ ජේ.එම්. පීබල් මහතා අතට පත්වුණා. එතුමා පානදුරාවාදයේ එම මුද්‍රිත පිටපත එංගලන්තයට ගෙනගොස් පිටපත් දහස් ගණනක් මුද්‍රණය කොට බෙදා හැරීමට කටයුතු කරතිබෙනවා. එම පිටපත පානදුරාවාදය පවත්වා වසර පහකට පසු 1878දී ඕල්කට්තුමාගේ අතට පත්වීම ශ්‍රී ලංකාවේ බෞද්ධ පුනර්ජීවනය සමග වූ අධ්‍යාපනික පුනර්ජීවනයේ පදනම සකස් කරනු ලැබුවා.

ඕල්කට්තුමා ශ්‍රී ලංකාවේ බෞද්ධ පුනරුද ව්‍යාපාරයට සිය දායකත්වය ලබාදෙමින් ඇරඹූ ප්‍රධාන ව්‍යාපෘතිය මගින් අපේක්ෂා කළේ රටේ නොදියුණු පළාත්වල දරුවන්ට එලදායී අධ්‍යාපනය ලබාදීමයි. අධ්‍යාපනයේ පරමාර්ථ පිළිබඳ වූ ඕල්කට් දර්ශනය හඳුනා ගැනීම ඉතා වැදගත්. එය අප අද අවධානයට යොමුකරනු ලබන ජාතික එකමුතුව පිළිබඳ වන සංවාදයට මඟපෙන්වීමක් බව කිව යුතුයි.

හෙන්රි ස්ටීල් ඕල්කට්තුමා 1875 නොවැම්බර් 17 වැනි දින ඇමෙරිකාවේ ආරම්භ කළ පරම විඥානාර්ථ සමාගමේ පරමාර්ථ සැකෙවින් හෝ සඳහන් කිරීම උචිත යැයි මා කල්පනා කරනවා. වර්ණ භේද, ජාති භේද, කුල භේද, ආගම් භේදවලින් විනිර්මුක්තව, සත්‍ය සෙවීමට නැගවූ සංවිධානයක් ලෙස එතුමන් ආරම්භ කළ එම සමාගමේ ප්‍රධාන පරමාර්ථ තුනක් දකින්නට ලැබුණා.

පළමුවැන්න වූයේ වර්ණ භේද, ජාති භේද, කුල භේද, ආගම් භේද යනාදී කිසිදු භේදයකින් තොරව සමස්ත මනුෂ්‍ය සංහතියම එකම සහෝදර බැම්මකින් බැඳී තිබීමයි. දෙවැන්න සෑම ආගමක්ම, සෑම න්‍යාය ධර්මයක්ම, අපක්ෂපාතීව ප්‍රගුණ කිරීමට ධෛර්යය දීමයි. තෙවැන්න වූයේ ස්වභාව ධර්මය හා මනුෂ්‍යයාගේ අභ්‍යන්තරික බලය පිළිබඳ කරුණු ගවේෂණය කිරීමයි.

වර්තමානයේ අප මුහුණ පා ඇති ප්‍රධානතම ගැටලුවලට මෙම පරමාර්ථ මැනැවින් හඳුනාගන්නේ නම් විසඳුම් ලබාගැනීම අපහසු නොවන බව පැහැදිලියි. ලොවපුරා අර්බුද රැසක් මතුව ඇත්තේ ජාතිවාදී ස්වරූපයෙන් හෝ ආගම්වාදී ස්වරූපයෙනුයි. එක් ජාතියක් තවත් ජාතියක් යටපත් කරගැනීමට දරන උත්සාහයක් හෝ තවත් ආගමික මතවාදයක් තුළින් තවත් ආගමික මතවාදයක් නිශේධනය කරන්නට දරන උත්සාහයක් අපට දකින්නට පිළිවන්. එවැනි ලෝකයකට ඕල්කට්තුමන් පෙන්වා දී ඇති මඟ කෙතරම් විචාරශීලී වූවක්ද? ඕල්කට් පාසල් දරුවන් වන අප සැම යළිත් මෙම දර්ශනය ඉස්මතු කිරීමට කටයුතු කළ යුතු බව මගේ විශ්වාසයයි.

වොන් හෙල්ඩර් නම් දාර්ශනිකයා සඳහන් කරනුයේ නියම ත්‍රස්තවාදය නම් ජාතිවාදය බවයි. ජාතිවාදීන් යනු මිනිස් සමාජය නසන මුග්ධයෝ යනුවෙන් වී.අයි. ලෙනින් ප්‍රකාශ කර තිබෙනවා.

එක් ජාතියක් තවත් ජාතියකට යටත්ව සිටින කල යටත්ව සිටින ජාතියකට නායකත්වය දීම යනු ජාතික විමුක්තිකාමයයි. තම නිජභූමිය තමන්ට අහිමි වී ඇත්නම් එය ලබාගැනීම ස්වදේශකාමයයි. පීඩාවට පත් ජාතියකට පීඩාව යනු සාමාන්‍ය ස්වභාවයයි. සටනක් අවසන් වන්නේ කටකතාවලින් නොවේ. ජාතික සටනක් නිමාවන්නේ ජාතික විමුක්තිය ලැබීමෙන් පසුවයි.

අන් ජාතියේ නිදහස නොදකින්නා තමන්ගේ ජාතික නිදහස නොදකී. ආයුධවලින් ජාතියක් යටත් කර තැබිය හැක්කේ කෙටි කලකට පමණක් බව ලෝක ඉතිහාසය පුරාම අප අත්විඳින සත්‍යයක්. ඕල්කට් දර්ශනය තුළින් අපට පෙන්වා දෙන්නේ සමමෙත, සමසිත, සමජීවනය තුළින් ලෝකය ගොඩනගන මාර්ගයයි.

අප බෙදෙන්නට උත්සාහ දරනුයේ නොදැනුවත්කම නිසා බව එතුමා ඉතා පැහැදිලිව පෙන්වා දී තිබෙනවා. සෑම ආගමක්ම අපක්ෂපාතීව ප්‍රගුණ කරන්නට, කටයුතු කිරීමට කරනු ලබන ඉල්ලීම තුළින් එය පැහැදිලියි. අන්‍ය ආගම්වලට ගරු නොකරන්නා සැබෑ බෞද්ධයෙක් නොවන බවට ධර්මාශෝක රජතුමා සටහන් කළ ශිලාලේඛනයේ මතය මේ තුළින් මනාව ඉස්මතු වෙනවා. මේ සියල්ල තුළින් අප ඕල්කට් දර්ශනය වඩ වඩාත් ගැඹුරින් සමාලෝචනය කළ යුතු අවධියකට එළැඹ තිබෙන බව පැහැදිලියි.

ඕල්කට්තුමන් තමාගේ පරම විඥානාර්ථ සමාගමේ ආදර්ශ පාඨය බවට පත්කර ගන්නේ යටගිය දවස බරණැස් නුවර [illegible] රජදරුවන්ගේ ආදර්ශ පාඨය වූ 'සත්‍යයට වඩා උසස් ආගමක් නැත' යන්නයි. වර්තමානයේදී අප මුහුණ දී ඇති ප්‍රබලම අභියෝගයක් වන්නේ සත්‍ය යටපත් වී අසත්‍ය ඉස්මතු වීමයි. සත්‍යවාදී මිනිසාට සමාජය තුළ ඇති අවස්ථාවන් අඩුවීමයි. මෙයට ප්‍රධානම හේතුව විමසා බැලීම වැදගත්. මන්ද අප කතා කරනුයේ ඵලයක් ගැන මිස එම ඵලය ලබාදුන් හේතුව ගැන නොවන නිසයි.